සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

33 | S | II

## දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020
## Second Term Test - Grade 12 - 2020

විභාග අංකය .............................

**ගිණුම්කරණය II**

කාලය පැය තුනයි විනාඩි 10 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10)

**උපදෙස්**

- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහක ට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාල පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

01. නිමි ඇඳුම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක නියුතු සුමුදුමාලිගේ ව්‍යාපාරය 8% එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියා පදිංචි ව්‍යාපාරයකි. එහි 2019.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වෙයි.

| විස්තරය | රු. '000 | |
|---|---|---|
| විකුණුම් | | 5400 |
| ගැණුම් | 1080 | |
| ඉඩම් හා ගොඩනැගිලි | 3800 | |
| යන්ත්‍ර උපකරණ | 1200 | |
| මෝටර් රථ (18.10.01 මිලට ගත්) | 500 | |
| සමුච්තක්ෂය (18.04.01) දිනට) | | |
| ගොඩනැගිලි | | 160 |
| යන්ත්‍ර උපකරණ | | 120 |
| වෙළඳ ලැබිය යුතු දැ | 460 | |
| වැටුප් | 200 | |
| 15% ස්ථාවර තැන්පතු | 600 | |
| ප්‍රචාරණ වියදම් | 50 | |
| බැංකු ණය පොලී | 20 | |
| වියදම් මත VAT | 120 | |
| ලිපි ද්‍රව්‍ය වියදම | 40 | |
| තොගය 2018.04.01 | 1884 | |
| මුදල් ශේෂය | 46 | |
| 10% බැංකු ණය | | 200 |
| ලැබූ ස්ථාවර තැන්පත් පොලී | | 70 |
| ආදායම් මත VAT | | 100 |
| වෙළඳ ලැබිය යුතු දැ මත හානිකරන අලාභ සඳහා ඉඩ හැරීම (2018.04.01) | | 30 |
| ගෙවිය යුතු EPF | | 20 |
| ප්‍රාග්ධනය | | 3900 |
| | **10,000** | **10,000** |

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත ගැලපීම් කළ යුතුව ඇත.

1. 2019.03.31 දිනට ගබඩාවේ පිරිවැය 600 බැගින් වූ ඒකක 1000 තිබූ අතර, එම තොග ඒකකයක් රු. 100 ක වියදමක් දරමින් රු.650 බැගින් විකිණිය හැකි බව ඇස්තමේන්තු කර ඇත.
2. රු. 3,600,000 ක වටිනා ඉඩම් හැර අනෙකුත් සියළුම ජංගම නොවන වත්කම් (දේපල පිරියත උපකරණ) වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතුය.

3. ගැනුම් හා විකුණුම් VAT සහිතව දක්වා ඇත.
4. වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ ලෙස රු. 10,000 කපාහල යුතු අතර, රු. 50,000 ක් හානිකරන අලාභ සඳහා ඉඩහැරීමක් කළ යුතුය.
5. සේවක අර්ථ සාධක අරමුද, (EPF) සඳහා සේවකයා හා සේව්‍යා පිළිවෙලින් 10% හා 15% බැගින් දායක වන අතර, සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සේව්‍යා 3% දායක වේ. සේවක අර්ථසාධක අරමුදල් සේවක දායක ගිණුම් තැබීම හැර වෙනත් කිසිදු සටහනක් තබා නැත.
6. ප්‍රචාරක වියදම් රු. 50,000 ක් ගෙවිය යුතුව ඇත.
7. බැංකු ණය ලබාගෙන ඇත්තේ, 2019.01.01 දිනය එදිනම වාර්ෂික පොලීය ගෙවා ඇත.
8. අයිතිකරු විසින් ඔහුගේ නිවසට රැගෙන ගිය රු. 10,000 නිමි ඇඳුම් තොග ගැන පොත්වල සටහන් කර නැත.
9. රු. 10,000 ලිපි ද්‍රව්‍ය 2019.03.31 දිනට ඉතිරි වී ඇත.
10. ව්‍යාපාරය විසින් රු. 5000 නිමි ඇඳුම් ළමා නිවාසයකට පරිත්‍යාග කර තිබේ.

**අවශ්‍ය වන්නේ,**

1) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
2) 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(ලකුණු 40)**

02. මානෙල් වෙළඳ ව්‍යාපාරයේ 2020.01.01 දිනට පැවති සියළු වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| විස්තරය | රු. '000 | |
|---|---|---|
| දේපළ පිරියත උපකරණ | 360 | |
| සමුච්ත ක්ෂය | (120) | 240 |
| තොගය | | 100 |
| වෙළඳ ලැබිය යුතු දෑ | | 25 |
| මුදල් | | 50 |
| | | **415** |
| බැංකු ණය | | 125 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 40 |
| | | **165** |

2020 ජනවාරි මාසයේදී පහත ගණුදෙනු සිදු විය.

1. පිරිවැය රු. 40,000 වූ භාණ්ඩ රු. 60,000 කට ණයට විකිණීම.
2. රු. 50,000 ක කාර්යාල උපකරණයක් මිලට ගැනීම.
3. රු. 12,000 ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම. එම භාණ්ඩවල පිරිවැය රු. 8000 කි.
4. රු. 10,000 බැංකු ණය වාරිකය ගෙව්වා. එහි ඇතුළත් පොලිය රු. 1000 කි.
5. ණය හිමියෙකුට ගෙවිය යුතු 24,000 ක් ඔහුගෙන් ව්‍යාපාරයට ණය ගැතියෙකු ලෙස ලැබිය යුතු රු. 25,000 ට හිලව් කිරීම.
6. මානෙල් තම දරුවාගේ රක්ෂණ වාරිකය වූ රු. 5000 ක් ව්‍යාපාරික මුදලින් ගෙවීම.
7. රු. 15,000 ක සේවක වැටුප් ගෙවීම.
8. ලැබූ ගෙවල් කුලී ආදායම් රු. 5000 කි.
9. ව්‍යාපාරයේ කාර්යාල වියදම් 15,000 ක් වූ අතර මෙයින් 10,000 ක් මානෙල් විසින් පෞද්ගලිකව ගෙවන ලද අතර ඉතිරිය ව්‍යාපාරය විසින් ගෙවන ලදී.

**අවශ්‍ය වන්නේ,**

1). ඉහත ගණුදෙනුවල බලපෑම පහත ගිණුම්කරණ සමීකරණ භාවිතා කරමින් පෙන්නුම් කර එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද අඩුවේනම් (-) ද යන්න සඳහන් කරන්න. (පහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිතා කරන්න.)

| **අනු අංකය** | **වත්කම්** | | | | **වගකීම්** | | **හිමිකම්** | |
|---|---|---|---|---|---|---|---|---|
| | **දෙ.පි.උ.** | **තොගය** | **වෙළඳ ලැබිය යුතු දෑ** | **මුදල්** | **බැංකු ණය** | **ගෙ. යු. දෑ** | **ප්‍රාග්ධනය** | **රඳවා ගත් ඉපැයුම්** |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| ....... | | | | | | | | |

2) 2020.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය
4) 2020.01.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(ලකුණු 40)**

03. 2019.03.31 දිනට මයුර ව්‍යාපාරයේ පහත තොරතුරු දැකිය හැකිවිය.

| | (රු.) |
|---|---|
| 1. මුදල් ශේෂය | 90,000 |
| 2. කෙටුම්පත් ලාභය | 165,000 |

කෙසේ වුවද පසුව කළ ගිණුම් පරීක්ෂාවේ දී පහත වැරදි සිදු වී ඇති බව සොයාගෙන ඇත.

1. විකුණුම් ජ'නලය එකතු කිරීමේදී වටිනාකම තීරුව රු. 10,000 ක් අඩුවෙන් එකතු කර ඇත.
2. අත්පිට ගැණුම් වෙනුවෙන් නිකුත් කළ රු. 60,000 චෙක්පත මුදල් ගෙවීම් ජනලයේ සටහන් කර ඇත්තේ රු. 6000 ලෙසිනි.
3. 2019.03.31 දිනට නිමි භාණ්ඩ තොගය රු. 12,000 ක් අධි ගණනය වී ඇත.
4. රු. 8000 ලද වට්ටම් ණය හිමි පාලන ගිණුමේ සටහන් කළ ද වෙනත් කිසිදු සටහන් තබා නැත.
5. 2019.03.31 දිනට ලද බැංකු ප්‍රකාශනයේ පහත තොරතුරු දැකිය හැකි වූ අතර ව්‍යාපරයේ පොත්වල ඒවා සටහන් කර නැත.
   i. ස්ථාවර නියෝග යටතේ ගෙවූ රක්ෂණ වාරික 15,000
   ii. ණය ගැති ප්‍රේෂණ රු. 25,000
   iii. බැංකුව අයකල බැංකු ගාස්තු 5000
6. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු.90,000 වූ අතර නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් 50,000 කි.

**අවශ්‍ය වන්නේ,**

1). 1 සිට 5 දක්වා වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන් සංලක්ෂයද සමඟ
2) අවිනිශ්චිත ගිණුම
3) ලාභය සංශෝධනය කිරීමේ ප්‍රකාශනයක්
4) සංශෝධිත මුදල් ගිණුම
5) බැංකු සැසඳුම් ප්‍රකාශනය **(ලකුණු 40)**

04. අ) පහත තොරතුරු VAT සඳහා ලියාපදිංචි වූ ප්‍රදීප්ගේ ව්‍යාපාරයට අදාල වේ. (VAT ප්‍රතිශතය 8% කි.) සියළු වටිනාකම් VAT රහිතව දක්වා ඇත.

| | | (රු.) | |
|---|---|---|---|
| 1. | ප්‍රදීප් ප්‍රාග්ධනය ලෙස යෙදූ මුදල | 250,000 | |
| 2. | අත්පිට ගැණුම් | 100,000 | |
| 3. | පාලිතගෙන් ණයට ගැණුම් | 150,000 | |
| 4. | මුදලින් ගෙවූ වියදම් | 50,000 | |
| 5. | අත්පිට විකුණුම් | 200,000 | |
| 6. | රමණිට ණයට විකුණුම් | 400,000 | |
| 7. | ලැබූ ආදායම් | 30,000 | |
| 8. | පාලිතට මුදල් ගෙව්වා | 90,000 | ලද වට්ටම 10% |
| 9. | රමණිගෙන් මුදල් ලැබුණා | 150,000 | දුන් වට්ටම රු. 10000 |
| 10. | රංගනට විකුණුම් | 160,000 | |
| 11. | ප්‍රදීප් විසින් රැගෙන ගිය මුදල | 5000 | |
| 12. | රංගන විසින් ආපසු එවුම් | 60,000 | |
| 13. | බැංකු ණය ලබාගැනීම | 500,000 | |
| 14. | නාලිකාගෙන් ගැණුම් | 300,000 | |
| 15. | නාලිකාට ආපසු යැවුම් | 100,000 | |
| 16. | නාලිකාගේ ණය පියවීමට මුදල් ගෙව්වා | 120,000 | 10%වට්ටමකට යටත්ව |
| 17. | බැංකු ණය ආපසු ගෙවීම | 50,000 | |

**අවශ්‍ය වන්නේ,**

1). මුදල් ලැබීම් ජ'නලය (VAT තීරුව සහිත) 2) මුදල් ගෙවීම් ජ'නලය (VAT තීරුව සහිත
3) ගැණුම් ජ'නලය 4) විකුණුම් ජ'නලය
5) ආපසු යැවුම් ජ'නලය 6) ආපසු එවුම් ජ'නලය **(ලකුණු 30)**

ආ) මාලිකාගේ ව්‍යාපාරයේ 2018.04.01 දිනට හා 2019.03.31 දිනට ගිණුම් ශේෂ සමහරක් පහත දැක්වේ.

| **අයිතමය** | **2018.04.01 දිනට** | රු. | **2019.03.31 දිනට** | රු. |
|---|---|---|---|---|
| 1. ණය පොලී | ගෙවිය යුතු | 2000 | ඉදිරියට කල ගෙවීම් | 4000 |
| 2. ආයෝජන ආදායම් | කලින් ලැබූ | 5000 | ලැබිය යුතු | 2000 |
| 3. ලිපි ද්‍රව්‍ය | ශේෂය | 1500 | ශේෂය | 3000 |
| 4. ගෙවල් කුලී | කලින් ගෙවූ | 1000 | ගෙවිය යුතු | 5000 |
| 5. ලද කොමිස් | ලැබිය යුතු | 4000 | කලින් ලැබූ | 2000 |

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ පහත ගණුදෙනු සිදුවී ඇත.

1. ගෙවූ ණය පොලී රු. 8000
2. ලැබූ ආයෝජන ආදායම් රු. 6000
3. ලිපිද්‍රව්‍ය මිලට ගැනීම් රු. 7500
4. ගෙවූ ගෙවල් කුලී රු. 9000
5. ලැබූ කොමිස් ආදායම් රු. 10000

**අවශ්‍ය වන්නේ,**

1). 2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කළ යුතු වටිනාකම්

2) 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු ජංගම වත්කම් හා ජංගම වගකීම් වෙන් වෙන්ව දක්වන්න. **(ලකුණු 10)**

**(මුළු ලකුණු 40)**

05. අ) 2019.03.31 දිනට **සිතුම්** ව්‍යාපාරයේ පහත ගැළපුම් කළ යුතුව ඇත.

1. 2019.03.31 දිනට තොගයේ පිරිවැය රු. 85000 වූ අතර එම තොගයේ ශුද්ධ උපලබ්ධිය අගය රු. 80,000 විය.
2. 2019.03.31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ (ණයගැති) වටිනාකම රු. 125,000 වූ අතර, ඉන් රු.5000 ක ණය ගැතියෙකු මිය ගොස් තිබූ අතර, ඉතිරි වෙළඳ ලැබිය යුතු දෑ මත රු. 20,000 ක හානිකරණ අලාභ සඳහා ඉඩ හැරිය යුතුය.
3. සිතුම් විසින් පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන ගිය රු.15000 ක් පිරිවැය වූ භාණ්ඩ පිළිබඳ සටහන් තබා නැත.
4. මාසික රක්ෂණ වාරිකය රු.6000 වන අතර, 2019.03.31 දිනට රක්ෂණ ගිණුමේ ශේෂය රු. 60,000 ක් විය.
5. වර්ෂය තුළ රු. 85,000 විකුණුම් අත්තිකාරමක් ලැබී ඇත. ඉන් රු. 50,000 ක තොග ගනුදෙනු කරුට සපයා ඇත. මේ පිළිබඳ කිසිදු සටහනක් තබා නැත.
6. i) 2018.10.01 දින රු. 600,000 කට මෝටර් රථයක් මිලට ගැනීම.
   ii) එම මෝටර් රථය වාර්ෂිකව 10% බැගින් පිරිවැයට ක්ෂය කිරීම.
   ඉහත ගණුදෙනු හා සිද්ධියට අදාල ගිණුම් තැබීමක් කර නැත.
7. රු. 200 ට වැය කර ස්ටෙප්ලරයක් (කටු ඇමුණුම් යන්ත්‍රයක්) මිලට ගත්තද ඒ පිළිබඳව පොත්වල ලියා නැත.

**අවශ්‍ය වන්නේ,**

පහත අකෘතිය භාවිතා කරමින් ඉහත ගැලපුම් කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් ලියා අදාල ගිණුම්කරණ සංකල්පය ලියා දක්වන්න.

| **ගැලපුම් අංකය** | **ජර්නල් සටහන** | **සංකල්පය** |
|---|---|---|
| 1) | ........................................................................................ | ................................................................. |
| - | ........................................................................................ | ................................................................. |

**(ලකුණු 20)**

ආ) පහත දැක්වෙන්නේ පසිඳුගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ මූල්‍ය ප්‍රකාශන වේ.

| **පසිඳුගේ ව්‍යාපාරය (A)<br>2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා<br>ආදායම් ප්‍රකාශනය (B)** | |
|---|---|
| විකුණුම් | 5000 |
| (-) විකුණුම් පිරිවැය **(C)** | (3000) |
| දළ ලාභය | 2000 |
| මෙහෙයුම් වියදම් | (500) |
| වර්ෂයේ ලාභය ප්‍රාග්ධනය | **1500** |
| ගිණුමට මාරු කලා **(D)** | |

**පසිඳුගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | | | (රු.'000) **(E)** |
|---|---|---|---|
| | **පිරිවැය (G)** | **ස. ක්ෂය** | **ධා. අගය** |
| **ජංගම නොවන වත්කම් (F)** | | | |
| මෝටර් රථ | 5000 | 500 | 4500 |
| **ජංගම වත්කම්** | | | |
| ඉදිරියට ගෙවූ කුලී **(H)** | | 200 | |
| තොගය (පිරිවැයට) **(I)** | | 700 | |
| ප්‍රාග්ධනය | | 5000 | |
| (-) ගැනිලි **(J)** | | (100) | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු විදුලිය **(K)** | | 50 | |

**අවශ්‍ය වන්නේ,**

එක් එක් ඉංග්‍රීසි අක්ෂරයට අදාළ ගිණුම්කරන සංකල්පය ලියා දක්වන්න. **(ලකුණු 11)**

**(මුළු ලකුණු 40)**

06. 2018.04.01 දිනට සීමිත පාරමී සමාගමේ පහත ශේෂයන් දැකිය හැකි විය.

| | | (රු.) |
|---|---|---|
| ණය ගැතියන් | නිමේෂ් | 150,000 |
| | රමේෂ් | 450,000 |
| | කමේෂ් | 300,000 |
| ණය හිමියන් | දැහැමි | 90,000 |
| | රුවිනි | 85,000 |
| | හෂිනි | 60,000 |

වර්ෂය තුළ සිදු වූ ගණුදෙනු වල සාරාංශයන් පහත දැක්වේ.

| | | (රු.) |
|---|---|---|
| විකුණුම් ජ'නලයේ එකතුව | | 650,000 |
| ණයට ගැනුම් | දැහැමි | 100,000 |
| | රුවිනි | 150,000 |
| | හෂිනි | 90,000 |
| ආපසු එවුම් ජ'නලයේ එකතුව | | 60,000 |

| | | (රු.) |
|---|---|---|
| **මුදල් ලැබීම් ජ'නලයේ** | | |
| වට්ටම් තීරුවේ එකතුව | | 7,000 |
| ණයගැති ලැබීම් තීරුවේ එකතුව | | 390,000 |

මුදල් ගෙවීම් ජ'නලයේ

| | **ණය හිමි ගෙවීම්** | **ලද වට්ටම්** |
|---|---|---|
| දැහැමි | 95,000 | 10,000 |
| රුවිනි | 100,000 | 5,000 |
| හෂිනි | 50,000 | 8,000 |

| **පොදු ජ'නලයෙන් ලබා ගත් තොරතුරු** | | (රු.) |
|---|---|---|
| කපාහළ හානිකරන අලාභ | | 8,000 |
| ණයගැතියන්ගෙන් ලැබි අගරු වූ චෙක්පත් | | 6,000 |
| අහිමිකළ දුන් වට්ටම් | | 5,000 |
| | | |
| ආපසු යැවුම් | දැහැමි | 15,000 |
| | හෂිනි | 12,000 |

2019.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂයේ එකතුව ණය ගැති ශේෂ ලැයිස්තුවේ එකතුව සමග එකඟ නොවුණි. පසුව කරන ලද පරීක්ෂණයේ දී පහත වැරදි අනාවරණය විය.

1. විකුණුම් ජ'නල එකතුව 3000 ක් වැඩි වී තිබීම.
2. රු. 1000 ක බැර ශේෂයක් සහිත ණය ගැතියෙකු ශේෂ ලැයිස්තුවෙන් මග හැරී ඇත.
3. දුන් වට්ටම් තීරුවේ එකතුව ණය ගැති පාලන ගිණුමේ රු. 5000 ක් ලෙස සටහන් වී ඇත.
4. කපාහල බොල් ණය පොදු ලෙජරයේ ගිණුම්ගත කර තිබුණේ 18000 ලෙසටය.
5. රු. 5000 ක බැර පතක් පොත්වල ලියා නැත.
6. ණය ගැතියෙකුගෙන් ලැබූ අගරු වූ චෙක්පත හා අහිමි කළ වට්ටම උපලෙජරයේ සටහන් වී නැත.

**අවශ්‍ය වන්නේ,**

1). ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ණයගැති පාලන ගිණුම සහ ණය හිමි පාලන ගිණුම
2). ණය හිමි උපලෙජරය සහ ණයහිමි ශේෂ ලැයිස්තුව
3) සංශෝධිත ණයගැති පාලන ගිණුම
4) ණයගැති පාලන ගිණුමේ ශේෂය සහ ශේෂ ලැයිස්තුවේ එකතුව සැසදීමේ ප්‍රකාශනය

**(ලකුණු 40)**

❋❋❋